
Jesus Film Project®
A Cru Ministry

# සළකා බලන්න

# යේසුස්වහන්සේ ගැන



**සමාජයීය කුඩා කණ්ඩායම් සඳහා**
**සති 10ක උපායමාර්ගයක්**

# සළකා බලන්න යේසුස්වහන්සේ ගැන

## සමාජයීය කුඩා කණ්ඩායම් සඳහා සති 10ක උපායමාර්ගයක්

*චිත්‍රපටිය භාවිතා කරමින්, මැග්දලේනා: ලැජ්ජාවෙන් මුදවන ලදී, යේසුස්වහන්සේ කවුද සහ උන්වහන්සේ අනුගමනය කිරීම යනු කුමක්ද කියා මිනිසුන්ට වඩාත් පැහැදිලිව තේරුම්ගැනීම සඳහා.*

Jesus Film Project®
A Cru Ministry

## නායකයාගේ මාර්ගෝපදේශය

# ඔබගේ සමාජය තුළ දෙවියන්වහන්සේගේ රාජ්‍යය ගොඩනැඟීම සඳහා උන්වහන්සේ ඔබව අරුත්බර ආකාරවලින් පාවිච්චි කරනු ඇත.

ඔබ පළමු වරට යේසුස්වහන්සේ කවුද යන්න දැනගත් අවස්ථාව මොහොතකට සිහිකරන්න - උන්වහන්සේගේ දයානුකම්පාව, උන්වහන්සේගේ මුදු මොලොක් බව, උන්වහන්සේගේ ශුද්ධකම, උන්වහන්සේගේ මෘදුකම, උන්වහන්සේගේ රාජකීයත්වය. උන්වහන්සේ ඔබ බලාපොරොත්තුවූ සියල්ල වූ අතර ඔබව සුරැකීමට සහ මුදවාගැනීමට හැකි සියල්ල වූ සේක. උන්වහන්සේ ඔබේ බලාපොරොත්තුව වන අතර සියළු ජාතීන්ට සහ සියළු මනුෂ්‍යයින්ගේ බලාපොරොත්තුව වන සේක.

යොහන් අපොස්තුළුතුමා එළිදරව් පොතේ මෙසේ ලියා ඇත:

“ඉන්පසු සියලු ජාතීන්ගෙන් ද ගෝත්‍රවලින් දජන සමූහයාගෙන් ද භාෂාවන්ගෙන් ද කිසිවෙකුට ගණන් නොකළ හැකි තරම් ඉමහත් පිරිසක්, සුදු සළු පැළඳ, තාල පත්‍ර අතින් ගෙන, සිංහාසනය හා බැටළු පෝතකයාණන් ඉදිරියෙහි සිටිනු මම දිටිමි. ඔව්හු මහ හඬින් මොරගසා ‘සිංහාසනයෙහි වැඩ හිඳින අපේ දෙවියන්වහන්සේගෙන් ද බැටළු පෝතකයාණන්ගෙන් ද ගැළවීම පැමිණේය’” (එළිදරව් 7:9-10, නව අනුවාදය 1990).

රජුන්ගේ රජ කවුද යන්න බලවත් දැනුම ඔබ සතුව ඇත. එමනිසා උන්වහන්සේව අන් අය සමඟ බෙදාගැනීමට සහ දෙවියන්වහන්සේගේ පවුල තුළ එකට වැඩෙන්නට ඔබව සූදානම් කරන්නට අපට අවශ්‍යව ඇත.

මතෙව් ශුභාරංචියේ අවසාන පද වල යේසුස්වහන්සේ මෙසේ කියා ඇත:

“එබැවින් ඔබ ගොස්, සකල ජාතීන් ගෝලයන් කරන්න; පියාණන්ගේ ද පුත්‍රයාණන්ගේ ද ශුද්ධාත්මයාණන්ගේ ද නාමයෙන් ඔවුන් බව්තීස්ම-ස්නාපනය කරන්න; මා ඔබට අණ කළ සියල්ල රක්ෂා කරන්න ඔවුන්ට උගන්වන්න. මම ද කල්පාන්තය දක්වා සදහට ම ඔබ හා සමඟ සිටිමි” යි වදාළ සේක (මතෙව් 28:19-20 නව අනුවාදය 1990).

උන්වහන්සේ අපට ගොස්, ගෝලයින් බිහිකරන්න, ඔවුන් බව්තිස්ම කර ඔවුන්ට උගන්වන්න යි කියන අතර උන්වහන්සේ සැමවිටම අප සමඟ ඉන්නා බවත්, සෑම මිටියාවතක් සහ කඳු මුදුනක් තුළින්ම අප සමඟ යන බවත් පවසන සේක. *යේසුස්වහන්සේ ගැන සළකා බලන්න* උපකාර කිරීමට මහත් උපායමාර්ගයක් පිරිණමයි. එය උපයෝගී කරගනිමින් යේසුස්වහන්සේ කවුද යන්න වඩාත් ගැඹුරින් ඉගෙන ගනිමින් තම ජීවිත එකට බෙදාගන්නා කැපවූ ගෝලයින් හැඩගස්වන්නට ඔබට උපකාර කළ හැකි වනු ඇත.

*යේසුස්වහන්සේ ගැන සළකා බලන්න*, මග්දලාවේ මරියාගේ සාක්ෂිය, ඇගේ ඇස් හරහා යේසුස්වහන්සේගේ බයිබලීය කථාන්දරය නිරූපණය කරන *මැග්දලේනා: ලැජ්ජාවෙන් මුදවන ලදී* යන චිත්‍රපටියෙන් කොටස් භාවිතා කරයි. පවුලේ සාමාජිකයන්, මිතුරන් සහ හඳුනන අය සමඟ කුඩා කණ්ඩායම් සැකසුමක භාවිතා කිරීමට එය විශිෂ්ඨ මෙවලමකි. ඔවුන් එක් එක් කොටස නරඹන විට, සහභාගිවන්නන්ට යේසුස්වහන්සේගේ ජීවිතය, හාස්කම්, මරණය සහ නැවත නැඟිටීම පිළිබඳ තවත් ඉගෙන ගත හැකි වනු ඇත. බොහෝ දෙනෙකුට යේසුස්වහන්සේ කවුරුන්ද යන්න නිසාම උන්වහන්සේව අනුගමනය කිරීමට බලකිරීමක් දැනෙනු ඇති අතර තවත් සමහරෙකුට උන්වහන්සේ පිළිබඳ ඉගෙනගැනීමට තවත් අවස්ථා අවශ්‍ය වනු ඇත. චිත්‍රපටි මාලාව අවසානයේ *යේසුස්වහන්සේ ගැන සළකා බලන්න* තුළින් රිව්කා හෝ *යේසුස්වහන්සේ දැනගැනීම* යන ජීසස් ෆිල්ම් ප්‍රොජෙක්ට් විසින් නිපදවන ලද මෙවලම් භාවිතා කරමින් තව දුරටත් කුඩා කණ්ඩායම් සාකච්ඡා වලට ආරාධනාවක් ඉදිරිපත් කරයි.

*යේසුස්වහන්සේ ගැන සළකා බලන්න* භාවිතා කිරීමට සරල පියවර හතරක් ඇත.

# 1වෙනි පියවර

# 01

## ඔබට දිනාගන්න කැමති කවුද යන්න තීරණය කරගන්න

යේසුස්වහන්සේ පිළිබඳ වැඩියෙන් දැනගැනීමට අවශ්‍ය කෙනා කවුද? උන්වහන්සේ පිළිබඳ දැනගැනීමට අවශ්‍ය අසල ගම්මානයක් හෝ අසල්වැසියන් සිටියිද? මිතුරන් හෝ සගයන් කණ්ඩායමක්?

පළමුව, එම ස්ථානයේ “සාමයේ තැනැත්තෙක්” හඳුනාගන්න. ලූක් 10:6 හි යේසුස්වහන්සේ උන්වහන්සේගේ පණිවුඩය රැගෙන යාමට උන්වහන්සේගේ අනුගාමිකයන් 72ක් යවන්නේ ඔවුන් ගිය සෑම ස්ථානයකම ඔවුන්ට සත්කාර කිරීමට සාමයේ තැනැත්තෙක් සොයාගන්නා ලෙස ඔවුන්ට උපදෙස් දෙමිනි.

සාමයේ තැනැත්තෙක් යනු ඇදහිලිවන්තයෙක්ම නොවන්නේය. ඒ තැනැත්තා:

- ක්‍රිස්තුස්වහන්සේ සහ උන්වහන්සේගේ ඉගැන්වීම් වලට විවෘත විය යුතුයි
- සමාජයේ බලගතු හෝ ප්‍රසිද්ධ කෙනෙක් විය යුතුයි
- ඔබ තෝරාගන්නා සමාජය තුළ ඔවුන්ගේ ජාලයට ඔබව හඳුන්වා දීමට කැමති සහ සූදානම්ව සිටිය යුතුයි
- මැග්දලේනා චිත්‍රපටිය නැරඹීමට අන් අයට ආරාධනා කිරීමට ඔබට උපකාර කරන්නට සූදානම්ව සිටිය යුතුයි

මෙම තැනැත්තා සමඟ සම්බන්ධතාවක් ගොඩනඟන ලෙසට අප ඔබට යෝජනා කරමු. ඔබගේ සාමයේ තැනැත්තා සමඟ ඔබගේ සම්බන්ධතාවය ගොඩනඟා ගැනීමට මෙම පියවර තුනේ ක්‍රියාවලිය මඟපෙන්වීමේ මෙවලමක් ලෙස ඔබට භාවිතා කළ හැකිය.

**අ. යාච්ඤාව**
මෙම සාමයේ තැනැත්තා වෙනුවෙන් යාච්ඤා කරන්න. එම තැනැත්තා කවුද යන්න ඔබට පෙන්වන ලෙස යාච්ඤා කරන්න. ඔබව ඔවුන්ගේ පවුලට සහ මිතුරන්ට හඳුන්වා දෙන කෙනෙක්. ඔබ මෙම තැනැත්තා හඳුනාගන්නා අතරතුර ඔවුන් වෙනුවෙන් යාච්ඤා කළ හැක්කේ කෙසේද යයි අසන්න.

**ආ. සැළකිලිමත්වන්න**
ඔබගේ නව මිතුරා වෙනුවෙන් යාච්ඤා කරමින් ඔහුගේ අවශ්‍යතා තේරුම්ගන්නා අතර, ඔහුට සවන් දීමෙන් සහ එම ප්‍රකාශ කරන ලද අවශ්‍යතා සපුරාලීමෙන් ඔබ ඔහු ගැන සැළකිලිමත් වන බව පෙන්වන්න. අව්‍යාජ සහ සහයෝගය දක්වන මිතුරෙක් වන්න.

**ඇ. බෙදාගන්න**
අප මිනිසුන්ට සවන් දෙමින් ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලන්නට උපකාර කරන විට, අපට යේසුස්වහන්සේ පිළිබඳ සුභාරංචිය බෙදාගැනීමේ වරප්‍රසාදය ලැබෙනු ඇත. අවස්ථාව ලැබුනු විට, ඔවුන් යේසුස්වහන්සේ ගැන දන්නේ නැත්නම්, උන්වහන්සේ පිළිබඳ සුභාරංචිය සහ උන්වහන්සේගේ සමාව පිළිබඳ ඔබගේ සාමයේ තැනැත්තා සමඟ බෙදාගන්න.

# 2වන පියවර

# 02

## *මැග්දලේනා: ලැජ්ජාවෙන් මුදවන ලදී පෙන්වන්න*

මෙම උපක්‍රමයට, අපි උදාහරණයක් වශයෙන් කාන්තා කණ්ඩායමක් උපයෝගී කරගමු. කෙසේවෙතත්, පුරුෂයන් සහ පවුල්වලටත් *යේසුස්වහන්සේ ගැන සළකා බලන්න* භාවිතා කිරීමට දිරිමත් කරන්නෙමු!

ඔබගේ සාමයේ තැනැත්තා සමඟ, *මැග්දලේනා* චිත්‍රපටිය නැරඹීමට කාන්තාවන් කීප දෙනෙකුට ආරාධනා කරන්න. මෙය සාමයේ තැනැත්තාගේ නිවසේ විය හැක. කෑම වේලක් බෙදාගෙන පසුව චිත්‍රපටිය නරඹන්නට හෝ නරඹන අතරතුර කෙටි ආහාර සහ බීමක් බෙදාගත හැක. සහභාගී වන සෑම කෙනෙකුටම හොඳින් සළකමින් ත්‍යාගශීලී ආගන්තුක සත්කාරය දක්වන්න.

*මැග්දලේනා*, ජීසස් ෆිල්ම් ප්‍රොජෙක්ට් වෙබ් අඩවියෙන් සහ ජීසස් ෆිල්ම් ප්‍රොජෙක්ට් ඇප් හරහා භාෂා 200කට වඩා නොමිලේ ලබා ගත හැක.  ඔබට යූඑස්බී පෝට් එකක් සමඟ රූපවාහිනී යන්ත්‍රයක් ඇත් නම්, *මැග්දලේනා* ෆලෑශ් ඩ්‍රයිව් එකක් භාවිතා කරමින් නැරඹිය හැකිය. ඔබට බිල්ටුවුන් ස්පීකරයක් සමඟ ටැබ්ලට් පරිඝණකයක් ඇත්නම්, 10 දෙනෙකුගෙන් යුත් කුඩා කණ්ඩායමක් හෝ වඩා විශාල ප්‍රදේශයක වැඩි දෙනෙකුට පෙන්විය හැක.

චිත්‍රපටිය අවසානයේ, වැඩිදුර සම්බන්ධවීම සඳහා ඔබේ ප්‍රේක්ෂකයින්ට ආරාධනා දෙකක් ඉදිරිපත් කරන්න:

පළමුව, කාන්තාවන්ට යේසුස්වහන්සේගේ අනුගාමිකයන් වන්නට ආරාධනා කරන්න. ඔබේ කථාව ඔවුන් සමඟ බෙදාගෙන චිත්‍රපටියේ ඔවුන් දුටු කථාන්දර සමඟ සම්බන්ධ කිරීම සළකා බලන්න.

දෙවනුව, යේසුස්වහන්සේ පිළිබඳ තවදුරටත් කථා කරන්නට ඊළඟ දවසේ පැමිණෙන්නට ආරාධනා කරන්න! උනන්දුවක් ඇති මිතුරන් රැගෙන එන්නට ඔවුන්ට අභියෝග කරන්න. මෙ ආකාරයෙන් ඔවුන්ට ඇති ප්‍රශ්න සාකච්ඡා කරන්නට හැකි වන අතර *යේසුස්වහන්සේ ගැන සළකා බලන්න* විෂය මාලාව තුළින් යේසුස්වහන්සේගේ කථාන්දර අධ්‍යයනය කරන්නටද හැකි වනු ඇත.

පසුව, සහභාගී වූ කාන්තාවන් හඳුනාගැනීමට කාලය වැය කරන්න. ඔවුන් චිත්‍රපටියේ දුටු කථාවන් සහ තේමාවන් තුළින් ඔවුන්ගේ කථාවේ වේදනාකාරී අත්දැකීම් මතුපිටට ගෙන එන්නට ඉඩ ඇත. අවශ්‍ය නම් ඔවුන් වෙනුවෙන් පුද්ගලිකව යාච්ඤා කරන්නට ඉදිරිපත් වෙන්න.

දැන් එන්නේ හොඳම කොටසයි!

# 3 වන පියවර

# 03

## ඔබගේ අලුත් *යේසුස්වහන්සේ ගැන සළකා බලන්න* සමාජයේ කුඩා කණ්ඩායම ආරම්භ කරන්න

කුඩා කණ්ඩායම සහ යේසුස්වහන්සේ ගැන උනන්දුවක් දැක්වූ සෑම කාන්තාවක් සමඟම යාච්ඤා කරන්න - ඇගේ හදවත ශුද්ධාත්මයාණන් විසින් මෘදු කර හරවන ලෙසට යාච්ඤා කරන්න. යේසුස්වහන්සේගේ සෑම කථාවක්ම ඔවුන්ට සැළකිය යුතු සහ අරුත්බර ආකාරයකින් බලපානු ඇති බවටත්, ඔවුන් පෞද්ගලිකව එම කථා සමඟ සම්බන්ධ වන ලෙසත් යාච්ඤා කරන්න.

මෙම රැස්වීම සහ ඉදිරියට ඇති රැස්වීම් වලදී ඔබ මැග්දලේනා චිත්‍රපටියේ කොටස් 10 යේසුස්වහන්සේ පිළිබඳ එකතුවී වැඩියෙන් ඉගෙනගෙන උන්වහන්සේ පිළිබඳ කථාකරන්නට භාවිතා කරන්න. එක් එක් කොටස සඳහා සාමාන්‍ය තේමාවන් මෙසේය:

1. සෑම කාන්තාවක්ම දකිනු සහ දැනගනු ලැබීම
2. යේසුස්වහන්සේ: ප්‍රොපේතවරයෙකුට වඩා බොහෝ දේ
3. වහල්භාවයෙන් මිදීම
4. යේසුස්වහන්සේගේ දයානුකම්පාව
5. ගැටුම් සහ අගතිය
6. සුවය සහ ප්‍රතිස්ථාපනය
7. ලැජ්ජාව සහ ගෞරවය
8. යේසුස්වහන්සේ සහ උන්වහන්සේගේ සමාව දැනගැනීම
9. යේසුස්වහන්සේ පිළිගන්නට සහ අන් අය සමඟ බෙදාගැනීමට ආශාව
10. යේසුස්වහන්සේ සමඟ ජීවත්වීම

ඉදිරි සති කීපය තුළ, ඔබේ නව කණ්ඩායම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳ සහ උන්වහන්සේගේ අනුගාමිකයෙක් වීම යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න පිළිබඳ අවබෝධයෙන් වැඩෙනු ඇත. කිතුණු සමාජයක ජීවිතය අත්විඳීමටද ඔවුන්ට අවස්ථාව ලැබේ.

සෑම රැස්වීමක් සඳහාම අපි ශක්තිමත් මිත්‍රත්වයන් ගොඩනැඟීම සඳහා තුනෙන් තුන (3/3) ආකෘතිය ලෙස හඳුන්වන ක්‍රමය භාවිතා කරමු. 3/3 ආකෘතිය යනු ප්‍රායෝගික කණ්ඩායම් ව්‍යුහයක් වන අතර එය ඔබගේ රැස්වීම් සඳහා පහසු ප්‍රවාහයක් සහ පිළිවෙලක් සපයන අතර චේතාන්විතභාවය, දිරිගැන්වීම සහ වැඩීම සහතික කරයි. එය කොටස් තුනකින් සමන්විත වේ: ආපසු හැරී බැලීම, වැඩිදුර බැලීම සහ ඉදිරිය බැලීම.

සටහන: *යේසුස්වහන්සේ ගැන සළකා බලන්න* සකසා ඇත්තේ දෙවියන්වහන්සේගේ කැඳවීම ඉටු කිරීමට ඔබට උපකාර වීම සඳහා සැකිල්ලක් ලෙසය. **ඔබගේ සංස්කෘතික අවශ්‍යතා වලට ගැලපෙන ආකාරයෙන් මෙය සකසා ගන්නට ඔබට නිදහස ඇත!**

# තුනෙන්-තුන

**නායකත්වයට පුහුණුකිරීමේ ක්‍රියාවලියක්**

## ආපසු හැරී බැලීම

- **සැළකිලිමත් වෙන්න:** ඔබ කෙසේද කියා බෙදාගන්න. ජීවිත කථා සහ පසුබිම බෙදාගන්න.
- **නමස්කාරය:** ගායනා සහ යාච්ඤාව තුළින් එකට නමස්කාර කරන්න.
- **විශ්වාසවන්තකම සමරන්න:** ඔබ ඉගෙනගන්නා දේ අදාල කරගන්නා ආකාරය බෙදාගන්න.
- **දර්ශනයක් දෙන්න:** යේසුස්වහන්සේට ඔබේ ජීවිතය වෙනස් කළ හැකි ආකාරය ගැන බෙදාගන්න. එකිනෙකා දිරිමත් කරන්න.

## වැඩිදුර බැලීම

- **පෙන්වන්න:** එක් එක් කොටස දෙවරක් බලන්න. යේසුස්වහන්සේ පිළිබඳ අළුත් කථාවක් එකට ඉගෙනගන්න.
- **කියන්න:** එම කොටසේ කථාව තමන්ගේ වචනවලින් කියන්නට එක් කෙනෙකුට ආරාධනා කරන්න.
- **සම්පූර්ණ කරන්න:** කථාවේ අඩුපාඩු පුරවන්න අනෙක් අයට ආරාධනා කරන්න.
- **සාකච්ඡා කරන්න:** තිබෙන කාලය අනුව හැකි තරම් ප්‍රශ්න සාකච්ඡා කරන්න.

## ඉදිරිය බැලීම

- **අදාළ කරගැනීම:** ඔබ ඉගෙනගත් දේ අදාල කරගන්නේ කෙසේද කියා තීරණය කරගන්න.
- **පුරුදු වෙන්න:** එකිනෙකාට කථාව කියන්න.
- **බෙදාගන්න:** ඔබ කථාව කියන්නේ කාටද යන්න සාකච්ඡා කරන්න.
- **යාච්ඤා කරන්න:** අප ඉගෙනගත් දේ ගැන දෙවියන්වහන්සේට ස්තුති කරන්න. එකිනෙකා වෙනුවෙන් සහ සමාජයේ අනෙක් අය වෙනුවෙන් යාච්ඤා කරන්න.

# හතරවන පියවර

04

## ඊළඟ පියවර ගන්න

*යේසුස්වහන්සේ ගැන සළකා බලන්න* හි අවසාන පාඩමේ කිතුණු ජීවිතයක් ගතකිරීම ගැන සාකච්ඡා කරයි. මෙම කොටසේ, මරියා යේසුස්වහන්සේ අනුගමනය කිරීමේ උතුම් කැඳවීම මෙන්ම ඒ සඳහා ගෙවිය යුතු මිලය වටහාගෙන තිබුණි. ඔබේ කණ්ඩායමේ සාමාජිකයන් සූදානම් නම් ඔවුන්ගේ මීළඟ පියවර වෙත මඟපෙන්වීම වැදගත් වනු ඇත. **ඔබගේ කණ්ඩායමේ සාමාජිකයන්ගෙන් එක්කෙනෙකුට හෝ වැඩිදෙනෙකුට ඔවුන්ගේම *යේසුස්වහන්සේ ගැන සළකා බලන්න* කණ්ඩායමක් ආරම්භ කර ඔවුන් සොයාගත් දේ අන් අය සමඟ බෙදාගැනීමට අභියෝග කිරීමට මෙය කදිම අවස්ථාවක් විය හැක.** ඔබගේ කණ්ඩායමට තව දුරටත් රැස්වෙන්නට කැමති නම්, *රිව්කා* හෝ *යේසුස්වහන්සේ දැනගැනීම* වැනි අළුත් කණ්ඩායම් අධ්‍යයනයකට යොමු වන ලෙසට අප යෝජනා කරමු. මෙම අධ්‍යයනයන් දෙක ගැන වැඩි විස්තර පහත සඳහන් කර ඇත:

*රිව්කා* තොරතුරු පිටුව:
www.jesusfilm.org/partners/resources/strategies/women/gather-and-grow/

*යේසුස්වහන්සේ දැනගැනීම* තොරතුරු පිටුව:
www.jesusfilm.org/partners/resources/strategies/knowing-jesus/

*යේසුස්වහන්සේ දැනගැනීම* ප්‍රවර්ධන වීඩියෝව:
www.youtube.com/watch?v=MkYpNK5OvKk

# නායකයාගේ ඉක්මන් යොමු මඟපෙන්වීම

## එක් එක් කොටසේ පාඩම කරන ආකාරය

මැග්දලේනා කොටස් කීපයකට බෙදා ඇත්තේ, යේසුස්වහන්සේ මනුෂ්‍යයාගේ දුෂ්චරිතය බලවත් ලෙස ජයගත් ආකාරය දුටු මරියාගේ ජීවිතයේ අවස්ථාවන් වඩාත් හොඳින් අධ්‍යයනය කරන පිණිසය. ඔබගේ ගවේෂණාත්මක අධ්‍යයනයට මඟපෙන්වීමට වඩාත් හොඳම ආකාරය නම් සපයා ඇති ආකෘතිය අනුව එක් එක් කොටස වෙන වෙනම අධ්‍යයනය කිරීමයි.

සෑම සතියකම සෑම ප්‍රශ්නයක්ම සාකච්ඡා කිරීම අවශ්‍ය නැත. ප්‍රධාන කාරණය වන්නේ යේසුස්වහන්සේ කවුද යන්න සහ මරියාගේ වෙනස්වීම පිළිබඳව එක් එක් කොටස හෙළි කරන දේ ඔබේ කණ්ඩායම් සාමාජිකයන්ට නිදහසේ සාකච්ඡා කිරීමට ඉඩ හැරීමයි. පහසුකම් සළසන්නා ලෙස ඔබගේ කණ්ඩායමට ආරක්ෂිත වාතාවරණයක් ඇති කර දීම ද ඔබේ වගකීමයි. මෙසේ කරන්නට, සවන් දීම සහ මඟපෙන්වීම ඔබගේ භූමිකාවයි. මෙය කණ්ඩායම් සාකච්ඡාවක් මිස දේශනා කිරීමට අදහස් කර ඇති කාලයක් නොවේ.

චිත්‍රපටියේ කොටස් නැරඹීමට ඔබගේ ජීසස් ෆිල්ම් ප්‍රොජෙක්ට් ඇප් වෙත ගොස් එක් එක් කොටස සොයාගැනීමට පහත දක්වා ඇති ඒවායේ මාතෘකාවන් ඇල අකුරු වලින් සළකුණු කර ඇත. එසේත් නැත්නම් ජීසස් ෆිල්ම් ප්‍රොජෙක්ට් වෙබ් අඩවියෙන් jesusfilm.org/watch හරහා සොයාගත හැක.

## මැග්දලේනා චිත්‍රපටියෙන් මෙම අධ්‍යයනය සඳහා භාවිතා කර ඇති එක් එක් කොටස් මෙසේය:

**1 වෙනි පාඩම:** සෑම කාන්තාවක්ම දකිනු සහ දැනගනු ලැබීම (කොටස: *මග්දලාවේ මරියා රිව්කාගේ නිවසට යයි*).
**2 වෙනි පාඩම:** යේසුස්වහන්සේ: ප්‍රොපේතවරයෙකුට වඩා බොහෝ දේ (කොටස: *මරියාට දැනුම් දීම*).
**3 වෙනි පාඩම:** වහල්භාවයෙන් මිදීම (කොටස: *මග්දලාවේ මරියා යක්ෂ ආත්මයන්ගෙන් මුදවනු ලැබීම*).
**4 වෙනි පාඩම:** යේසුස්වහන්සේගේ දයානුකම්පාව (කොටස: *යේසුස්වහන්සේ වැන්දඹුවගේ පුත්‍රයා නැඟිටුවීම*).
**5 වෙනි පාඩම:** ගැටුම් සහ අගතිය (කොටස: *සමාරියයේ කාන්තාව*).
**6 වෙනි පාඩම:** සුවය සහ ප්‍රතිස්ථාපනය (කොටස: *මහා ලේ රෝගයෙන් පෙලුණු කාන්තාව*).
**7 වෙනි පාඩම:** ලැජ්ජාව සහ ගෞරවය (කොටස: *කාමමිථ්‍යාචාරයේ යෙදුණු කාන්තාවට සමාව දීම*).
**8 වෙනි පාඩම:** යේසුස්වහන්සේගේ මරණය සහ නැවත නැඟිටීම (කොටස: *යේසුස්වහන්සේගේ මරණය සහ නැවත නැඟිටීම මරියා විස්තර කරයි*).
**9 වෙනි පාඩම:** යේසුස්වහන්සේ සහ උන්වහන්සේගේ සමාව දැනගැනීම (කොටස: *රිව්කා අඳහාගනියි*).
**10 වෙනි පාඩම:** යේසුස්වහන්සේ සමඟ ජීවත්වීම (කොටස: *කිතුණු ජීවිතය ගත කිරීම*).

***දෙවියන්වහන්සේගේ රාජ්‍යය ව්‍යාප්ත කිරීම සඳහා ඔබව පාවිච්චි කරන පිණිස ඔබ උන්වහන්සේ විශ්වාස කරන විට දෙවියන්වහන්සේ ඔබට ආශිර්වාද කෙරේවා යයි අපි යාච්ඤා කරන්නෙමු.***

# 1 වෙනි පාඩම සෑම කාන්තාවක්ම දකිනු සහ දැනගනු ලැබීම
## මග්දලාවේ මරියා රිව්කාගේ නිවසට යයි (ගීතාවලිය 139)

ආපසු හැරී බැලීම

### සැළකිලිමත් වෙනවා
• ඔබ කෙසේද කියා බෙදාගන්න.
• ත්‍යාගශීලීවන්තකම පුරුදු වෙන්න.

### නමස්කාරය
• ගායනා සහ යාච්ඤාව තුළින් එකට නමස්කාර කරන්න.

### විශ්වාසවන්තකම සමරන්න
• ජයග්‍රහන වලදී එකිනෙකා දිරිමත් කරන්න.

### දර්ශනයක් දෙන්න
• යේසුස්වහන්සේගේ කැපවූ අනුගාමිකයන් වන පිණිස එකිනෙකා දිරිමත් කරන්න

---

වැඩිදුර බැලීම

ඔබගේ භාෂාවෙන් මෙම කොටස නැරඹීමට ඔබේ ස්මාර්ට් උපාංගයෙහි මෙම QR කේතය භාවිතා කරන්න.

පාළුකරයක මැද, නැතිවී, තනිවී, සිත්තැවුලට පත්වී සිටි හාගාර් නම් වහල් කාන්තාව දෙවියන්වහනසේට හමුවිය. බයිබලය මෙසේ පවසයි, "තවද, ඇ තමාට කතා කළ සමිඳාණන්වහන්සේට,'ඔබ සියල්ල දකින දෙවියෝය.' යන තේරුම ඇති එල්-රෝයි කියා නම් කළාය. ඒ මන්ද, 'මා දුටු තැනැන්වහන්සේ මාත් දැක මම තව ම ජීවත් ව සිටිනවා නොවෙම් දැ' යි ඇ තමාගෙන්ම ප්‍රශ්න කළ බැවිනි" (උත්පත්ති 16:13-14, නව අනුවාදය 1990). අද අප එක්ව, සැබවින්ම අප එක් එක් කෙනාව දකින සහ දන්නා දෙවියන්වහන්සේ පිළිබඳ ඉගෙනගන්නා ගමන ආරම්භ කරමු.

**1 වෙනි පියවර: පෙන්වන්න.** එකම කොටස දෙවරක් බලන්න.
**2 වෙනි පියවර: කියන්න.** එම කොටසේ කථාව තමන්ගේ වචන වලින් කියන්නට කණ්ඩායමේ සාමාජිකයෙකුගෙන් ඉල්ලා සිටින්න.
**3 වෙනි පියවර: සම්පූර්ණ කරන්න.** කථාවේ අඩුපාඩු පුරවන්න හෝ නිවැරදි කිරීම් කරන්නට කණ්ඩායමට ඉඩ හරින්න.
**4 වෙනි පියවර: සාකච්ඡා කරන්න.** කණ්ඩායම් සාකච්ඡාව. සටහන: සියලුම ප්‍රශ්න අවසන් කරන්නට අවශ්‍ය නැත.

*1. කථාන්දරයේ ඔබ වඩාත්ම කැමති වූයේ කුමක්ද? ඔබේ අවධානය ගත්තේ කුමක්ද?*
*2. දෙවියන්වහන්සේ ඇයට ප්‍රේමකරයිද නැතහොත් ඇයව හඳුනයි ද වත් කියා රිව්කා සැක කිරීමට හේතුව කුමක් කියා ඔබ සිතන්නේද?*
*3. අද දෙවියන්වහන්සේ පිළිබඳ කථාකරන බොහෝ දෙනා සිටියි. දෙවියන්වහන්සේ සැබවින්ම අප ගැන කුමක් සිතන්නේද කුමක් දැනෙන්නේද කියා අපට දැනගත හැක්කේ කෙසේද?*
*4. ගීතාවලිය 139:1-18 දක්වා කියවන්න. දෙවියන්වහන්සේ අපව කොයිතරම් හොඳට දන්නවාද පිළිබඳ දාවිත් ප්‍රොපේතවරයා කුමක් කියන්නේද?*

**ගැඹුරට යාම (කාලය ඇත්නම් සාකච්ඡාව තව දුරටත්)…**
*5. දෙවියන්වහන්සේ ඔබ ගැන සෑම දෙයක්ම දකින බවත් තේරුම්ගන්නා බවත් දැනගැනීම ඔබට දැනෙන්නේ කෙසේද?*
*6. දෙවියන්වහන්සේ අප ගැන සියළු දේ දන්නා බවත්, එනමුත් උන්වහන්සේ අපට ප්‍රේමකරන්නටත් අපට මඟපෙන්වන්නටත් විශ්වාසවන්ත වන බවත් උන්වහන්සේ සෑම විටම අප සමඟ සිටින බවත් දාවිත් ලියා ඇත. සමහර විට අප මෙය විශ්වාස කිරීමට අපොහොසත් වන්නේ ඇයි කියා ඔබ සිතන්නේද?*

### නිගමනය
ඔබගේ මැවුම්කාරයාණන් විසින් ඔබව මුළුමණිනම දැනගැනීම සහ ඔබට මුළුමණින්ම ප්‍රේම කරනු ලැබීම යනු කුමන ආකාරද කියා මෙනෙහි කරන්න. ඔබගේ සෑම අංශයක්ම දැක, ආවරණය වී සහ අගය කරනු ලැබීම යනු කුමක්ද? ඔබගේ සෑම අසමත් වීමකටම යේසුස්වහන්සේ සමාව ලබා දෙන අතර ඔබගේ මුළු ජීවිතයටම සැළැමක් ඇත්තේය. උන්වහන්සේ වෙතට එන සෑම කෙනෙකුටම සදාකාල ජීවනය සහ උන්වහන්සේගේ සමීප වැඩසිටීම පොරොන්දු වන සේක. ඔබව මවනු ලැබුවේ උන්වහන්සේගේ ස්වරූපයෙන් සහ සමානත්වය ලෙසය. ඔබව දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් මවනු ලැබූ නිසා ඔබට ගෞරවය සහ වටිනාකමක් ලැබී ඇත (උත්පත්ති 1:26-27). යේසුස්වහන්සේ ගැන සළකා බලන්න.

---

ඉදිරිය බැලීම

### අදාළ කරගැනීම
- දෙවියන්වහන්සේ විශ්වාසවන්ත බව පෙන්වූයේ කෙසේද?
- ඔබ දෙවියන්වහන්සේ පිළිබඳ ඉගෙනගත් දේ අදාළ කරගන්නේ කෙසේද?

### පුරුදු වෙන්න
- එකිනෙකාට කථාන්දරය කියන්න පුරුදු වෙන්න.

### බෙදාගන්න
- ඔබ කථාන්දරය බෙදාගන්නේ කා සමඟද?

### යාච්ඤා කරන්න
- ඔබ ඉගෙනගත් දේ ගැන දෙවියන්වහන්සේට ස්තුති කරන්න.
- එකිනෙකා වෙනුවෙන් යාච්ඤා කරන්න.
- සමාජයේ අන් අය වෙනුවෙන් යාච්ඤා කරන්න.

# 2 වෙනි පාඩම යේසුස්වහන්සේ: ප්‍රොපේතවරයෙකුට වඩා බොහෝ දේ

## මරියාට දැනුම් දීම (ලූක් 1:26-37)

ආපසු හැරී බැලීම

### සැළකිලිමත් වෙනවා

- ඔබ කෙසේද කියා බෙදාගන්න.
- ත්‍යාගශීලීවන්තකම පුරුදු වෙන්න.

### නමස්කාරය

- ගායනා සහ යාච්ඤා තුළින් එකට නමස්කාර කරන්න.

### විශ්වාසවන්තකම සමරන්න

- ජයග්‍රහන වලදී එකිනෙකා දිරිමත් කරන්න.

### දර්ශනයක් දෙන්න

- යේසුස්වහන්සේගේ කැපවූ අනුගාමිකයන් වන පිණිස එකිනෙකා දිරිමත් කරන්න

---

වැඩිදුර බැලීම

ඔබගේ භාෂාවෙන් මෙම කොටස නැරඹීමට ඔබේ ස්මාර්ට් උපාංගයෙහි මෙම QR කේතය භාවිතා කරන්න.

යේසුස්වහන්සේට වසර සිය ගණනකට පෙර, යෙසායා අනාගතවක්තෘවරයා ඉශ්‍රායෙල්ට ලකුණක් දෙන සේක: කන්‍යාවක් පිළිසිඳගෙන පුත්‍රයෙකු බිහිකරන්නීය යයි අනාවැකි පැවසුවේය (යෙසායා 7:14). යෙසුස් නම් මෙම පුත්‍රයා උන්වහන්සේවම කොතරම් පහත් කලාද යත්, උන්වහන්සේ සියළු ජීවීන්ට වඩා යටත් පහත් වූ සේක: ළදරුවෙක්. උන්වහන්සේ මනුෂ්‍යාත්වය මුළුමණින්ම අත්විදිමින්, උන්වහන්සේ මුළුමණින්ම දෙවියන්වහන්සේ පමණක් නොව, මුළුමණින්ම මනුෂ්‍යයා බවද පෙන්වා දුන් සේක. අප සමඟ සම්බන්ධතාවය නැවත ඇති කර ගැනීම පිණිස උන්වහන්සේ වැඩීමේ වේදනාවන්, අසනීප, කුසගින්න, පිපාසය, ශෝකය සහ තුවාල වලටද මුහුණ දෙන්නට කැමැත්තෙන් සිටි සේක. එමෙන්ම යේසුස්වහන්සේ උපත ලැබූ විට, උන්වහන්සේ ඉපදුනේ කන්‍යාවකටය: කන්‍ය මරියා.

**1 වෙනි පියවර: පෙන්වන්න.** එකම කොටස දෙවරක් බලන්න.
**2 වෙනි පියවර: කියන්න.** එම කොටසේ කථාව තමන්ගේ වචන වලින් කියන්නට කණ්ඩායමේ සාමාජිකයෙකුගෙන් ඉල්ලා සිටින්න.
**3 වෙනි පියවර: සම්පූර්ණ කරන්න.** කථාවේ අඩුපාඩු පුරවන්න හෝ නිවැරදි කිරීම් කරන්නට කණ්ඩායමට ඉඩ හරින්න.
**4 වෙනි පියවර: සාකච්ඡා කරන්න.** සාකච්ඡා කරන්නට ප්‍රශ්න:

*1. කථාන්දරයේ ඔබ වඩාත්ම කැමති වූයේ කුමක්ද? ඔබේ අවධානය ගත්තේ කුමක්ද?*
*2. දේවදූතයාගේ පණිවිඩය ඇසූ විට මරියාට දැනුණේ කෙසේද කියා ඔබ සිතන්නේද? ඔබට එවැනි පණිවිඩයක් ලැබුණා නම් ඔබට දැනෙන්නේ කෙසේද?*
*3. "දෙවියන්වහන්සේට කළ නොහැකි දෙයක් නැත" යයි දේවදූතයා කිවේය. ඔබට මේ මොහොතේ කළ නොහැකියි කියා දැනෙන්නේ කුමක්ද?*
*4. බිළිඳාට "දෙවියන්වහන්සේගේ පුත්‍රයා" යයි කියනු ලබන්නේ යයි දේවදූතයා කීමෙන් අදහස් වන්නේ කුමක්ද?*

**ගැඹුරට යාම (කාලය ඇත්නම් සාකච්ඡාව තව දුරටත්)...**
*5. යේසුස්වහන්සේ කන්‍යාවක් තුළින් උපත ලැබීම වැදගත් වන්නේ ඇයි දැයි ඔබ සිතන්නේද?*

### නිගමනය

යේසුස්වහන්සේගේ පිළිසිඳ ගැනීම සහ උපතේ ඇදහිය නොහැකි ස්වභාවය ගැන මෙනෙහි කරන්න. උන්වහන්සේ ලෝකයේ මැවුම්කරුවාණන් සහ මනුෂ්‍යයෙක් වන්නේය. උන්වහන්සේ ගැළවුම්කරුවෙකු ලෙස අපට හඳුනාගත හැකි සහ විශ්වාස කළ හැකි කෙනෙකි. යේසුස්වහන්සේ ගැන සළකා බලන්න.

---

ඉදිරිය බැලීම

### අදාළ කරගැනීම

- දෙවියන්වහන්සේ විශ්වාසවන්ත බව පෙන්වූයේ කෙසේද?
- ඔබ දෙවියන්වහන්සේ පිළිබඳ ඉගෙනගත් දේ අදාළ කරගන්නේ කෙසේද?

### පුරුදු වෙන්න

- එකිනෙකාට කථාන්දරය කියන්න පුරුදු වෙන්න.

### බෙදාගන්න

- ඔබ කථාන්දරය බෙදාගන්නේ කා සමඟද?

### යාච්ඤා කරන්න

- ඔබ ඉගෙනගත් දේ ගැන දෙවියන්වහන්සේට ස්තුති කරන්න.
- එකිනෙකා වෙනුවෙන් යාච්ඤා කරන්න.
- සමාජයේ අන් අය වෙනුවෙන් යාච්ඤා කරන්න.

# 3 වෙනි පාඩම වහල්භාවයෙන් මිදීම
## මග්දලාවේ මරියා යක්ෂ ආත්මයන්ගෙන් මුදවනු ලැබීම (ලූක් 8:1-2)

ආපසු හැරී බැලීම

### සැළකිලිමත් වෙනවා
- ඔබ කෙසේද කියා බෙදාගන්න.
- ත්‍යාගශීලීවන්තකම පුරුදු වෙන්න.

### නමස්කාරය
- ගායනා සහ යාච්ඤාව තුළින් එකට නමස්කාර කරන්න.

### විශ්වාසවන්තකම සමරන්න
- ජයග්‍රහන වලදී එකිනෙකා දිරිමත් කරන්න.

### දර්ශනයක් දෙන්න
- යේසුස්වහන්සේගේ කැපවූ අනුගාමිකයන් වන පිණිස එකිනෙකා දිරිමත් කරන්න

---

වැඩිදුර බැලීම

මිනිස් ජාවාරම්, ඇබ්බැහිවීම්, පලායාම්. අද අපගේ ලෝකයේ විවිධාකාර වහල්භාවයන් පවතින්නේය. බයිබලය අපට උගන්වන්නේ මනුෂ්‍යයා පාපයට වහල් වී ඇති බවය. නමුත් නිදහස සොයාගත හැකි බවත් බයිබලය අපට උගන්වයි. මෙම කථාන්දරයේ, යක්ෂ ආත්මවලින් වහල්භාවයට පත්වී සිටි මරියා, යේසුස්වහන්සේගේ අධිකාරිය සහ බලය අත්දකින ආකාරය දකින්න.

**1 වෙනි පියවර: පෙන්වන්න.** එකම කොටස දෙවරක් බලන්න.
**2 වෙනි පියවර: කියන්න.** එම කොටසේ කථාව තමන්ගේ වචන වලින් කියන්නට කණ්ඩායමේ සාමාජිකයෙකුගෙන් ඉල්ලා සිටින්න.
**3 වෙනි පියවර: සම්පූර්ණ කරන්න.** කථාවේ අඩුපාඩු පුරවන්න හෝ නිවැරදි කිරීම් කරන්නට කණ්ඩායමට ඉඩ හරින්න.
**4 වෙනි පියවර: සාකච්ඡා කරන්න**. සාකච්ඡා කරන්නට ප්‍රශ්න:

*1. කථාන්දරයේ ඔබ වඩාත්ම කැමති වූයේ කුමක්ද? ඔබේ අවධානය ගත්තේ කුමක්ද?*
*2. මරියාගේ වහල්භාවය ඇයට පුද්ගලිකව සහ ඇගේ සමාජයට බලපෑ ආකාරය කෙසේද?*
*3. යේසුස්වහන්සේ මරියාට දැක්වූ ප්‍රතිචාරය තුළින් උන්වහන්සේ පිළිබඳ එළිදරව් වන්නේ කුමක්ද?*
*4. යේසුස්වහන්සේ විසින් මුදවනු ලැබූ පසු මරියාගේ ජීවිතය වෙනස් වූයේ කෙසේද?*

**ගැඹුරට යාම (කාලය ඇත්නම් සාකච්ඡාව තව දුරටත්)….**
*5. යක්ෂ ආත්මයන් යේසුස්වහන්සේ කවුදැයි දැනගෙන උන්වහන්සේට "දෙවියන්වහන්සේගේ ශුද්ධ තැනැත්තා" යයි හඬගැසීම වැදගත් වන්නේ ඇයි?*
*6. යේසුස්වහන්සේ මරියා මුදවනු ලැබීම දුටු පසු බලාසිටින්නන්උන්වහන්සේ පිළිබඳ කුමක් සිතුවාදැයි ඔබ සිතන්නේද?*
*7. ඔබ කථාවේ මරියා යයි සිතන්න. ඔබට යේසුස්වහන්සේ කෙරෙහි කුමක් දැනෙයිද කියා ඔබ සිතනවාද?*

ඔබගේ භාෂාවෙන් මෙම කොටස නැරඹීමට ඔබේ ස්මාර්ට් උපාංගයෙහි මෙම QR කේතය භාවිතා කරන්න.

### නිගමනය
මේ කථාවේ මරියා අත්වින්ද නිදහස පිළිබඳ මෙනෙහි කරන්න. ඇය නිදහස් වූ පසු ඇගේ ඇස් වල තිබූ පැහැදිලි බව, ඇය ප්‍රකාශ කළ කෘතඥතාවය සහ ඇගේ මුළු ජීවිතයේ වෙනස්වීම මතක් කරන්න. එම කොටසේ ආරම්භයේ සිටි කාන්තාවමද කියා ඔබට විශ්වාස කළ හැකිද? ඔබගේ වහල්භාවයන්ගෙන් සහ බන්ධන වලින් යේසුස්වහන්සේ ඔබව නිදහස් කළ විට දැණෙන සහනය ගැන සිතන්න. ඔබට අළුත් කරනු ලබන්නට කැමති කුමන ආකාරයෙන්ද? ඔබ උසුලාගෙන සිටින බර ඔබෙන් ඔසවාගන්නට උන්වහන්සේට ඉඩ හැර උන්වහන්සේව අනුගමනය කරන්න. යේසුස්වහන්සේ ගැන සළකා බලන්න.

---

ඉදිරිය බැලීම

### අදාළ කරගැනීම
- දෙවියන්වහන්සේ විශ්වාසවන්ත බව පෙන්වූයේ කෙසේද?
- ඔබ දෙවියන්වහන්සේ පිළිබඳ ඉගෙනගත් දේ අදාළ කරගන්නේ කෙසේද?

### පුරුදු වෙන්න
- එකිනෙකාට කථාන්දරය කියන්න පුරුදු වෙන්න.

### බෙදාගන්න
- ඔබ කථාන්දරය බෙදාගන්නේ කා සමඟද?

### යාච්ඤා කරන්න
- ඔබ ඉගෙනගත් දේ ගැන දෙවියන්වහන්සේට ස්තුති කරන්න.
- එකිනෙකා වෙනුවෙන් යාච්ඤා කරන්න.
- සමාජයේ අන් අය වෙනුවෙන් යාච්ඤා කරන්න.

# 4 වෙනි පාඩම යේසුස්වහන්සේගේ දයානුකම්පාව
## යේසුස්වහන්සේ වැන්දඹුවගේ පුත්‍රයා නැඟිටුවීම (ලූක් 7:11-17)

ආපසු හැරී බැලීම

### සැළකිලිමත් වෙනවා
- ඔබ කෙසේද කියා බෙදාගන්න.
- ත්‍යාගශීලීවන්තකම පුරුදු වෙන්න.

### නමස්කාරය
- ගායනා සහ යාච්ඤාව තුළින් එකට නමස්කාර කරන්න

### විශ්වාසවන්තකම සමරන්න
- ජයග්‍රහන වලදී එකිනෙකා දිරිමත් කරන්න.

### දර්ශනයක් දෙන්න
- යේසුස්වහන්සේගේ කැපවූ අනුගාමිකයන් වන පිණිස එකිනෙකා දිරිමත් කරන්න

---

වැඩිදුර බැලීම

ඔබගේ භාෂාවෙන් මෙම කොටස නැරඹීමට ඔබේ ස්මාර්ට් උපාංගයෙහි මෙම QR කේතය භාවිතා කරන්න.

ශෝකය විස්තර කර ඇත්තේ ගැඹුරු කණගාටුවක් ලෙසය. විශේෂයෙන් කෙනෙකුගේ මරණයෙන් මෙය ඇති විය හැක. මෙම කථාවේ වැන්දඹුව ශෝක වූයේ ඇගේ එකම පුත්‍රයාගේ මරණය හේතුවෙනි. යේසුස්වහන්සේ එම කාන්තාව වෙතට ගොස් ඇගේ හදවතේ අවශ්‍යතාවය සපුරා දෙන ආකාරය මරියා බලා සිටියාය. මෙම අවස්ථාවේ, යේසුස්වහන්සේ ඇගේ එකම පුත්‍රයාව සුවකරන්නට තෝරාගත් සේක. මෙයින් ඇයගේ වඩාත්ම වටිනා ත්‍යාගය ඇයට නැවත ලබා දුන් සේක. උන්වහන්සේ සෑමවිටම මෙසේ කරන්නට තෝරාගන්නේ නැති වුවත්, අපගේ සෑම අවස්ථාවකදීම, ඉමහත් වේදනාකාරී ශෝකය තුළින් වුවත්, උන්වහන්සේ අප සමඟ සිටින බව අපට විශ්වාසය තැබිය හැක.

**1 වෙනි පියවර: පෙන්වන්න.** එකම කොටස දෙවරක් බලන්න.
**2 වෙනි පියවර: කියන්න.** එම කොටසේ කථාව තමන්ගේ වචන වලින් කියන්නට කණ්ඩායමේ සාමාජිකයෙකුගෙන් ඉල්ලා සිටින්න.
**3 වෙනි පියවර: සම්පූර්ණ කරන්න.** කථාවේ අඩුපාඩු පුරවන්න හෝ නිවැරදි කිරීම් කරන්නට කණ්ඩායමට ඉඩ හරින්න.
**4 වෙනි පියවර: සාකච්ඡා කරන්න.** සාකච්ඡා කරන්නට ප්‍රශ්න:

*1. කථාන්දරයේ ඔබ වඩාත්ම කැමති වූයේ කුමක්ද? ඔබේ අවධානය ගත්තේ කුමක්ද?*
*2. යේසුස්වහන්සේ වැන්දඹුවට කථාකිරීම පිණිස කරමින් සිටි දේ නැවැත්වූ සේක. උන්වහන්සේගේ හදවත පිළිබඳ මෙයින් කුමක් එළිදරව් වන්නේද?*
*3. යේසුස්වහන්සේට මළවුන් නැගිටුවන්නට හැකිවීම උන්වහන්සේ ගැන පවසන්නේ කුමක්ද?*
*4. ඔබ කවදා හෝ බලාපොරොත්තුවක් නැති අවස්ථාවකට මුහුණ දී තිබෙනවාද?*

**ගැඹුරට යාම (කාලය ඇත්නම් සාකච්ඡාව තව දුරටත්)...**
*5. යේසුස්වහන්සේ පිරිමි දරුවා මළවුන්ගෙන් නැගිටවූ විට මිනිසුන් ප්‍රතිචාර දැකුවූයේ කෙසේද? වැන්දඹුව ප්‍රතිචාර දැකුවූයේ කෙසේද?*
*6. ඔබ මේ මෙහොතේ යම් කෙනෙක් හෝ යම් කාරණාවක් පිළිබඳ කණස්සල්ලෙන් සිටිනවාද? එසේ නම්, ඔබට එයට මුහුණ දෙන්නට උපකාර කරණ පිණිස දෙවියන්වහන්සේ විශ්වාස කිරීමට ඔබ සූදානම්ද?*

### නිගමනය
මළවුන්ට හුස්ම දිය හැක්කේ දෙවියන්වහන්සේට පමණි. යේසුස්වහන්සේ දෙවියන්වහන්සේ යන සත්‍යය පිළිබඳ මෙනෙහි කරන්න. උන්වහන්සේට මළවුන් නැවත නැඟිටුවන්නට පුළුවන්, උන්වහන්සේ එසේ කලා, මෙම මනුෂ්‍යයාට පමණක් නොව, උන්වහන්සේගේ සේවා කාළය තුළ තුන් වරක් එසේ කළ සේක. උන්වහන්සේ බලවත් පමණක් නොව, උන්වහන්සේ දයානුකම්පිත වන අතර මෘදුබවින් සහ සැනසිල්ලෙන් පිරී ඇත්තේය. යේසුස්වහන්සේ ගැන සළකා බලන්න.

---

ඉදිරිය බැලීම

### අදාළ කරගැනීම
- දෙවියන්වහන්සේ විශ්වාසවන්ත බව පෙන්වූයේ කෙසේද?
- ඔබ දෙවියන්වහන්සේ පිළිබඳ ඉගෙනගත් දේ අදාළ කරගන්නේ කෙසේද?

### පුරුදු වෙන්න
- එකිනෙකාට කථාන්දරය කියන්න පුරුදු වෙන්න.

### බෙදාගන්න
- ඔබ කථාන්දරය බෙදාගන්නේ කා සමඟද?

### යාච්ඤා කරන්න
- ඔබ ඉගෙනගත් දේ ගැන දෙවියන්වහන්සේට ස්තුති කරන්න.
- එකිනෙකා වෙනුවෙන් යාච්ඤා කරන්න.
- සමාජයේ අන් අය වෙනුවෙන් යාච්ඤා කරන්න.

# 5 වෙනි පාඩම ගැටුම් සහ අගතිය
## සමාරියයේ කාන්තාව (යොහන් 4:1-42)

ආපසු හැරී බැලීම

### සැළකිලිමත් වෙනවා
• ඔබ කෙසේද කියා බෙදාගන්න.
• ත්‍යාගශීලීවන්තකම පුරුදු වෙන්න.

### නමස්කාරය
• ගායනා සහ යාච්ඤාව තුළින් එකට නමස්කාර කරන්න.

### විශ්වාසවන්තකම සමරන්න
• ජයග්‍රහන වලදී එකිනෙකා දිරිමත් කරන්න.

### දර්ශනයක් දෙන්න
• යේසුස්වහන්සේගේ කැපවූ අනුගාමිකයන් වන පිණිස එකිනෙකා දිරිමත් කරන්න

---

වැඩිදුර බැලීම

ඔබ කිසිදිනක යම් කෙනෙක් විසින් විනිශ්චය කිරීමට හෝ පහත හෙළීම අත්දැක තිබෙනවාද? මෙම කථාවේ, කොන්කරනු ලැබූ සාමාරියේ ස්ත්‍රියක් ජල ලිඳට දිනපතා යන ගමන මරියා බලා සිටියා. මේ ස්ත්‍රිය දහවල් රශ්මියේ තනිවම, කිසිකෙනෙක් හමු නොවේවා යන බලාපොරොත්තුවෙන් ඇවිදින්නේය. ඇය ලිඳ ලඟට පැමිණි විට එහි මිනිසෙකු දැක කණගාටුවට පත් වෙයි. ඔහු මිනිසෙක් පමණක් නොව යුදෙව්වෙක් බවත් ඇයට අවබෝධ වෙයි. සමාරිතයන් යනු යුදෙව් සහ යුදෙව් නොවන මිනිසුන්ගේ සංකලනයන්වූ අතර ඔවුන් ආගමික අදහස් සහ විශ්වාසයන් මිශ්‍ර කළ සෙනඟකි. යුදෙව්වන් සහ සමාරිතයන් එකිනෙකාට වෛර කළ නමුත් කණ්ඩායම් දෙකම, ඔවුන්ගේ පාපවලට සමාව ලබා දෙන මෙසියස් හෝ ගැළවුම්කාරයෙක් එනතුරු බලා සිටියහ. යේසුස් නම් එම මිනිසා, සංස්කෘතික අවඥාව නොසළකා, ඇයට කථා කළ විට ඒ ස්ත්‍රියට ඇතිවූ පුදුමය ගැන සිතා බලන්න. කථාවේ අවසානය වන විට, කොන්කරනු ලැබූ ස්ත්‍රිය, යේසුස්වහන්සේ තමන් මෙසියස්වහන්සේ යයි පැහැදිලිවම එළිදරව් කරනු ලැබූ පළමු තැනැත්තා වන්නේය.

ඔබගේ භාෂාවෙන් මෙම කොටස නැරඹීමට ඔබේ ස්මාර්ට් උපාංගයෙහි මෙම QR කේතය භාවිතා කරන්න.

**1 වෙනි පියවර: පෙන්වන්න.** එකම කොටස දෙවරක් බලන්න.
**2 වෙනි පියවර: කියන්න.** එම කොටසේ කථාව තමන්ගේ වචන වලින් කියන්නට කණ්ඩායමේ සාමාජිකයෙකුගෙන් ඉල්ලා සිටින්න.
**3 වෙනි පියවර: සම්පූර්ණ කරන්න.** කථාවේ අඩුපාඩු පුරවන්න හෝ නිවැරදි කිරීම් කරන්නට කණ්ඩායමට ඉඩ හරින්න.
**4 වෙනි පියවර: සාකච්ඡා කරන්න.** සාකච්ඡා කරන්නට ප්‍රශ්න:

*1. කථාන්දරයේ ඔබ වඩාත්ම කැමති වූයේ කුමක්ද? ඔබේ අවධානය ගත්තේ කුමක්ද?*
*2. එම කාන්තාවගේ අතීතය පිළිබඳ යේසුස්වහන්සේ සියල්ල දැනගෙන සිටීම වැදගත් වන්නේ ඇයි?*
*3. තමන්ගේ ජීවිතය ගැනත් අතීත පාප ගැනත් යේසුස්වහන්සේ සියල්ල ඇයට කියූ විට ඇයට දැණුනේ කෙසේද කියා ඔබ සිතන්නේද?*
*4. යේසුස්වහන්සේ සමාරිය කාන්තාව සමඟ කථාකරනු දුටු විට ඔවුන්ගේ ප්‍රතිචාර වලින් ඔවුන්ගේ විරෝධය එළිදරව් වූයේ කෙසේද? මෙය යේසුස්වහන්සේ පිළිබඳ පවසන්නේ කුමක්ද?*

**ගැඹුරට යාම (කාලය ඇත්නම් සාකච්ඡාව තව දුරටත්)...**
*5. මෙම කථාවේ යේසුස්වහන්සේ උන්වහන්සේගේ අනුගාමිකයන්ට කුමක් උගන්වන්නට උත්සාහ කළාද යන්න ඔබ සිතන්නේද?*
*6. යේසුස්වහන්සේ, තමන් පොරොන්දුවූ මෙසියස්වහන්සේ යයි පැවසූ විට කාන්තාව කුමක් කළේද?*

### නිගමනය
ඔබගේ අතීතයේ සියල්ලම යේසුස්වහන්සේ දන්නා බව යන්නෙහි තේරුම ගැන සළකා බලන්න: ඔබ ගෙන ඇති සෑම දුර්වල තීරණයක්ම, ඔබගේ සෑම ලැජ්ජාසහගත මොහොතක්ම. දැන්, ඒ සියල්ල එළි පිට තිබියදීත්, උන්වහන්සේ තවමත් ඔබව දකින්නේ ගෞරවයෙන් සහ වැදගත් ලෙස යන සත්‍යය පිළිබඳ මෙනෙහි කරන්න.

---

ඉදිරිය බැලීම

### අදාළ කරගැනීම
- දෙවියන්වහන්සේ විශ්වාසවන්ත බව පෙන්වූයේ කෙසේද?
- ඔබ දෙවියන්වහන්සේ පිළිබඳ ඉගෙනගත් දේ අදාළ කරගන්නේ කෙසේද?

### පුරුදු වෙන්න
- එකිනෙකාට කථාන්දරය කියන්න පුරුදු වෙන්න.

### බෙදාගන්න
- ඔබ කථාන්දරය බෙදාගන්නේ කා සමඟද?

### යාච්ඤා කරන්න
- ඔබ ඉගෙනගත් දේ ගැන දෙවියන්වහන්සේට ස්තුති කරන්න.
- එකිනෙකා වෙනුවෙන් යාච්ඤා කරන්න.
- සමාජයේ අන් අය වෙනුවෙන් යාච්ඤා කරන්න.

# 6 වන පාඩම සුවය සහ ප්‍රතිස්ථාපනය
## මහා ලේ රෝගයෙන් පෙලුණු කාන්තාව (ලූක් 8:40-48)

ආපසු හැරී බැලීම

### සැළකිලිමත් වෙනවා
• ඔබ කෙසේද කියා බෙදාගන්න.
• ත්‍යාගශීලීවන්තකම පුරුදු වෙන්න.

### නමස්කාරය
• ගායනා සහ යාච්ඤාව තුළින් එකට නමස්කාර කරන්න.

### විශ්වාසවන්තකම සමරන්න
• ජයග්‍රහන වලදී එකිනෙකා දිරිමත් කරන්න.

### දර්ශනයක් දෙන්න
• යේසුස්වහන්සේගේ කැපවූ අනුගාමිකයන් වන පිණිස එකිනෙකා දිරිමත් කරන්න

---

වැඩිදුර බැලීම

ඔබගේ භාෂාවෙන් මෙම කොටස නැරඹීමට ඔබේ ස්මාර්ට් උපාංගයෙහි මෙම QR කේතය භාවිතා කරන්න.

ඔබ කිසිදිනක, ඔබේ ශාරිරික හෝ චිත්තවේගීය වේදනාවක් ඉවත් කරගැනීමට හැකි සෑම උත්සාහයක්ම ගෙන අසරණ වී සිටියේද? කිසිකෙනෙක් තමන් නොදකින බලාපොරොත්තුවෙන්, මේ කථාවේ කාන්තාව විශ්වාස කළේ ඇයට කෙසේ හෝ යේසුස්වහන්සේගේ සළුව අල්ලන්නට හැකි වුවහොත්, වසර ගණනාවක ප්‍රතිකාර හේතුවෙන් උත්සන්න වූ ලේ ගැලීමේ තත්වයෙන් ඇයට අවසානයේ සුවය ලබා ගත හැකි බවය. එකල පැවති ආගමික නීති අනුව ඇය අපිරිසිදු ලෙස සළකා සමාජයෙන් කොන්කරනු ලැබුවේ මේ ලේ ගැලීමේ රෝගය හේතුවෙනි. විශාල සෙනඟක් මැද, මරියා සහ අනෙක් අය අසල සිටියදී ඇය යේසුස්වහන්සේව අල්ලන්න තීරණය කළාය. කුමක් සිදුවේද බලන්න.

**1 වෙනි පියවර: පෙන්වන්න.** එකම කොටස දෙවරක් බලන්න.
**2 වෙනි පියවර: කියන්න.** එම කොටසේ කථාව තමන්ගේ වචන වලින් කියන්නට කණ්ඩායමේ සාමාජිකයෙකුගෙන් ඉල්ලා සිටින්න.
**3 වෙනි පියවර: සම්පූර්ණ කරන්න.** කථාවේ අඩුපාඩු පුරවන්න හෝ නිවැරදි කිරීම් කරන්නට කණ්ඩායමට ඉඩ හරින්න.
**4 වෙනි පියවර: සාකච්ඡා කරන්න.** සාකච්ඡා කරන්නට ප්‍රශ්න:

*1. කථාන්දරයේ ඔබ වඩාත්ම කැමති වූයේ කුමක්ද? ඔබේ අවධානය ගත්තේ කුමක්ද?*
*2. සෙනඟ ඉදිරියේ තමන්ව හඳුනාදෙන්නට යේසුස්වහන්සේ කාන්තාවට ආරාධනා කළේ ඇයි කියා ඔබ සිතන්නේද?*
*3. කාන්තාවගේ පාපොච්ඡාරණයට යේසුස්වහන්සේගේ ප්‍රතිචාරය වැදගත් වන්නේ ඇයි?*
*4. ඔබ කථාවේ කාන්තාව යයි සිතන්න. සුවය ලැබීමේ පළමු විනාඩි කීපය කෙසේ දැනෙයිද? ඔබට යේසුස්වහන්සේ කෙරෙහි දැනෙන්නේ කෙසේද?*

**ගැඹුරට යාම (කාලය ඇත්නම් සාකච්ඡාව තව දුරටත්)....**
*5. යේසුස්වහන්සේට අන් කිසිකෙනෙකුට කළ නොහැකි දේ කරන්නට පුළුවන් යන්නෙන් අදහස් වන්නේ කුමක්ද?*
*6. යේසුස්වහන්සේ හමුවන්නට පෙර කාන්තාවගේ ජීවිතය කෙසේ වී දැයි ඔබ සිතන්නේද?*

### නිගමනය
විශාල සෙනඟක් අතර, කාන්තාව අත දිගු කර යේසුස්වහන්සේගේ සළුව ඇල්ලුවාය. ඇය සළුව ඇල්ලූ විගසම ඇයගේ ශරීරයට සුවය ගලා එනවා ඇයට දැනුණේය. ඇය සුවපත් වූවා! ඇයට දැණුන සහනය සහ කෘතඥතාවය ගැන සිතා බලන්න. "දියණිය, ඔබේ ඇදහිල්ල ඔබව සුවකර ඇත. සාමයෙන් යන්න." යේසුස්වහන්සේ කී සේක. උන්වහන්සේගේ වචන මෙනෙහි කරන්න. ඇගේ පාපොච්ඡාරණයෙන් පසුව යේසුස්වහන්සේ මේ වචන කී සේක. ඇය අපිරිසිදු යැයි හංවඩු ගැසූ සෙනඟ ඉදිරියේ යේසුස්වහන්සේ ඇයට දියණිය යයි අමතා ඇගේ ඇදහිල්ලට ගෞරව කළ සේක. අපට දැණෙන වේදනාව ගැන යේසුස්වහන්සේ සැළකිලිමත් වන සේක. අපගේ කැඩුණු බිඳුණු තත්ත්වය තුළ අපව මුණගැසෙන්නට උන්වහන්සේ බලාසිටින සේක. යේසුස්වහන්සේ ගැන සළකා බලන්න.

---

ඉදිරිය බැලීම

### අදාළ කරගැනීම
• දෙවියන්වහන්සේ විශ්වාසවන්ත බව පෙන්වූයේ කෙසේද?
• ඔබ දෙවියන්වහන්සේ පිළිබඳ ඉගෙනගත් දේ අදාළ කරගන්නේ කෙසේද?

### පුරුදු වෙන්න
• එකිනෙකාට කථාන්දරය කියන්න පුරුදු වෙන්න.

### බෙදාගන්න
• ඔබ කථාන්දරය බෙදාගන්නේ කා සමඟද?

### යාච්ඤා කරන්න
• ඔබ ඉගෙනගත් දේ ගැන දෙවියන්වහන්සේට ස්තුති කරන්න.
• එකිනෙකා වෙනුවෙන් යාච්ඤා කරන්න.
• සමාජයේ අන් අය වෙනුවෙන් යාච්ඤා කරන්න.

# 7 වෙනි පාඩම ලැජ්ජාව සහ ගෞරවය
## කාමමිථ්‍යාචාරයේ යෙදුණු කාන්තාවට සමාව දීම (යොහන් 8:1-11)

ආපසු හැරී බැලීම

### සැළකිලිමත් වෙනවා
- ඔබ කෙසේද කියා බෙදාගන්න.
- ත්‍යාගශීලීවන්තකම පුරුදු වෙන්න.

### නමස්කාරය
- ගායනා සහ යාච්ඤාව තුළින් එකට නමස්කාර කරන්න.

### විශ්වාසවන්තකම සමරන්න
- ජයග්‍රහන වලදී එකිනෙකා දිරිමත් කරන්න.

### දර්ශනයක් දෙන්න
- යේසුස්වහන්සේගේ කැපවූ අනුගාමිකයන් වන පිණිස එකිනෙකා දිරිමත් කරන්න

---

උඩිදුර බැලීම

යේසුස්වහන්සේගේ කාලයේ ආගමික නායකයන් අවධානය දුන්නේ “මෝසෙස්ගේ ව්‍යවස්ථාව” යනුවෙන් හැඳින්වූ නීති රීති මාලාවකටය. ව්‍යවස්ථාව දෙවියන්වහන්සේ සමඟ සම්බන්ධතාවයක් තැබීම සඳහා මිනිසුන්ට එම ව්‍යවස්ථාව අකුරටම පිළිපැදිය යුතු විය. අවාසනාවකට, කිසිකෙනෙකුට ව්‍යවස්ථවේ සියළුම කාරණා පිළිපැදීමට නොහැක මන්ද අප හැමෝටම ඇත්තේ එකම ප්‍රශ්නයයි: පාපය. හෙබ්‍රෙව් භාෂාවෙන් පාපය යනු “අසමත් වීම” හෝ “ඉලක්කය වැරදීම” යි. ව්‍යවස්ථාවේ කොන්දේසි යටතේ, අප හැමකෙනෙක්ම මරණයට පත් විය යුතු වරදකරුවන් වන්නෝය. ගැළවුම්කාරයෙක් නැතිව අප හැමොම විනාශ වන්නෝය. එහෙත් යේසුස්වහන්සේ ලොව පහල වූයේ අපගේ පාපයට කුලිය ගෙවන පිණිස අප වෙනුවෙන් කැපවීමටය. මෙම කථාවේ, පව්කාර ස්ත්‍රියක් යේසුස්වහන්සේ වෙතට ගෙන එන්නේය. සිදුවන්නේ කුමක්ද කියා බලන්න.

**1 වෙනි පියවර: පෙන්වන්න.** එකම කොටස දෙවරක් බලන්න.
**2 වෙනි පියවර: කියන්න.** එම කොටසේ කථාව තමන්ගේ වචන වලින් කියන්නට කණ්ඩායමේ සාමාජිකයෙකුගෙන් ඉල්ලා සිටින්න.
**3 වෙනි පියවර: සම්පූර්ණ කරන්න.** කථාවේ අඩුපාඩු පුරවන්න හෝ නිවැරදි කිරීම් කරන්නට කණ්ඩායමට ඉඩ හරින්න.
**4 වෙනි පියවර: සාකච්ඡා කරන්න.** සාකච්ඡා කරන්නට ප්‍රශ්න:

*1. කථාන්දරයේ ඔබ වඩාත්ම කැමති වූයේ කුමක්ද? ඔබේ අවධානය ගත්තේ කුමක්ද?*
*2. නීතියට අනුව, කාමමිථ්‍යාචාරයේ යෙදී සිට අසුවුණ පුරුෂයා සහ ස්ත්‍රිය යන දෙදෙනාටම දඬුවම් ලැබිය යුතු නමුත් යේසුස්වහන්සේ වෙතට ගෙන එනු ලැබුවේ ස්ත්‍රිය පමණි. විනිශ්චය සඳහා ස්ත්‍රිය පමණක් ගෙන එනු ලැබුවේ ඇයි දැයි ඔබ සිතන්නේද?*
*3. යේසුස්වහන්සේ ආගමික නායකයන්ට සහ ස්ත්‍රියට දැක්වූ ප්‍රතිචාර වැදගත් වන්නේ ඇයි?*
*4. “මමද ඔබ හෙළා දකින්නේ නැත” යයි යේසුස්වහන්සේ කී විට ස්ත්‍රියට කුමක් දැනුනාද යයි ඔබ සිතන්නේද?*

**ගැඹුරට යාම (කාලය ඇත්නම් සාකච්ඡාව තව දුරටත්)…**
*5. යේසුස්වහන්සේ මෙසේ ප්‍රතිචාර දැක්වූයේ ඇයි දැයි ඔබ සිතන්නේද? ඔවුන්ට තෙරුම්ගන්නට උන්වහන්සේට අවශ්‍ය වූයේ කුමක්දැයි ඔබ සිතන්නේද?*
*6. ඔබ ආගමික නායකයන්ගේ ස්ථානයේ සිටියා නම්, යේසුස්වහන්සේගේ පිළිතුරට ඔබගේ ප්‍රතිචාරය කුමක් විය හැකිද?*

ඔබගේ භාෂාවෙන් මෙම කොටස නැරඹීමට ඔබේ ස්මාර්ට් උපාංගයෙහි මෙම QR කේතය භාවිතා කරන්න.

### නිගමනය
ස්ත්‍රියටත් ආගමික නායකයන්ටත් යේසුස්වහන්සේ ප්‍රතිචාර දැක්වූ ආකාරය ගැන මෙනෙහි කරන්න. මිනිසුන් ඇයව උන්වහන්සේ වෙතට ගෙන ආවේ ඇය ගැන සැළකිලිමත් වන නිසා නොව, ඇයව ලැජ්ජාවට පත් කර උන්වහන්සේව කොටුකරන්නට බව උන්වහන්සේ දැන සිටි සේක. ස්ත්‍රියගේ හැසිරීම අනුමත නොකරන්නටත් ආගමික නායකයන්ගේ පැත්ත නොගන්නටත් උන්වහන්සේ තොරාගත් සේක. උන්වහන්සේ ප්‍රඥාවන්ත සියළු දෙනාවම වරදකරුවන් බවට පත් කළ සේක. යේසුස්වහන්සේගේ හදවත බාණ්ඩ දෙකම පසුතැවිලි වීමට යොමු කළ ආකාරය ගැන සැළකිලිමත් වන්න. යේසුස්වහන්සේට පාපවලට සමාව දෙන්නට හැකිය - එය කළ හැක්කේ දෙවියන්වහන්සේට පමණි - මන්ද උන්වහන්සේ දෙවියන්වහන්සේ නිසාය. අපි යේසුස්වහන්සේගේ අනුගාමිකයන් වන්නට තෝරාගත් විට, උන්වහන්සේ අපට සමාව දෙමින් උන්වහන්සේ තුළ නව ජීවිතයක් පිරිණමන සේක. යේසුස්වහන්සේ ගැන සළකා බලන්න.

---

ඉදිරිය බැලීම

### අදාළ කරගැනීම
- දෙවියන්වහන්සේ විශ්වාසවන්ත බව පෙන්වූයේ කෙසේද?
- ඔබ දෙවියන්වහන්සේ පිළිබඳ ඉගෙනගත් දේ අදාළ කරගන්නේ කෙසේද?

### පුරුදු වෙන්න
- එකිනෙකාට කථාන්දරය කියන්න පුරුදු වෙන්න.

### බෙදාගන්න
- ඔබ කථාන්දරය බෙදාගන්නේ කා සමඟද?

### යාච්ඤා කරන්න
- ඔබ ඉගෙනගත් දේ ගැන දෙවියන්වහන්සේට ස්තුති කරන්න.
- එකිනෙකා වෙනුවෙන් යාච්ඤා කරන්න.
- සමාජයේ අන් අය වෙනුවෙන් යාච්ඤා කරන්න.

# 8 වන පාඩම යේසුස්වහන්සේගේ මරණය සහ නැවත නැඟිටීම
## යේසුස්වහන්සේගේ මරණය සහ නැවත නැඟිටීම මරියා විස්තර කරයි (මතෙව් 27-28)

ආපසු හැරී බැලීම

### සැළකිලිමත් වෙනවා
- ඔබ කෙසේද කියා බෙදාගන්න.
- ත්‍යාගශීලීවන්තකම පුරුදු වෙන්න.

### නමස්කාරය
- ගායනා සහ යාච්ඤාව තුළින් එකට නමස්කාර කරන්න.

### විශ්වාසවන්තකම සමරන්න
- ජයග්‍රහන වලදී එකිනෙකා දිරිමත් කරන්න.

### දර්ශනයක් දෙන්න
- යේසුස්වහන්සේගේ කැපවූ අනුගාමිකයන් වන පිණිස එකිනෙකා දිරිමත් කරන්න

---

වැඩිදුර බැලීම

ඔබගේ භාෂාවෙන් මෙම කොටස නැරඹීමට ඔබේ ස්මාර්ට් උපාංගයෙහි මෙම QR කේතය භාවිතා කරන්න.

යේසුස්වහන්සේගේ මරණ රාත්‍රියේදී, කාන්තාවන් ඉක්මණින් නිවෙස් වලට ගියේ උන්වහන්සේගේ දේහය කල් තබා ගැනීම සඳහා සුවඳ විලවුන් සූදානම් කිරීමටය. ඊළඟ දවසේ ඔවුන් සබත රක්ෂා කරමින් විවේක ගත්තේ පසු දිනයේ ස්වාමින්වහන්සේගේ දේහය වෙත නැවත යාමේ බලාපොරොත්තුවෙනි. යේසුස්වහන්සේ ලැබූ කස පහර සිහිවූ විට ඔවුන්ගේ ඇස්වලට කඳුළු ඉණුවේය. උන්වහන්සේගේ මරණයේ දර්ශන නැවත සිහිවූ විට ඔවුන්ගේ හදවත් වේදනාවෙන් පිරී ගියේය. ඔවුන්ගේ ප්‍රේමණීය මිතුරා, ඔවුන්ගේ ආරක්ෂකයා සහ රජතුමා, මිය ගොස් ඇත.

**1 වෙනි පියවර: පෙන්වන්න.** එකම කොටස දෙවරක් බලන්න.
**2 වෙනි පියවර: කියන්න.** එම කොටසේ කථාව තමන්ගේ වචන වලින් කියන්නට කණ්ඩායමේ සාමාජිකයෙකුගෙන් ඉල්ලා සිටින්න.
**3 වෙනි පියවර: සම්පූර්ණ කරන්න.** කථාවේ අඩුපාඩු පුරවන්න හෝ නිවැරදි කිරීම් කරන්නට කණ්ඩායමට ඉඩ හරින්න.
**4 වෙනි පියවර: සාකච්ඡා කරන්න.** සාකච්ඡා කරන්නට ප්‍රශ්න:

*1. කථාන්දරයේ ඔබ වඩාත්ම කැමති වූයේ කුමක්ද? ඔබේ අවධානය ගත්තේ කුමක්ද?*
*2. පැරණි ගිවිසුමේ ප්‍රොපේතවරුන් යේසුස්වහන්සේගේ මරණය පිළිබඳ අනාවැකි කීම වැදගත් වන්නේ ඇයි?*
*3. පාපය සහ මරණය සම්බන්ධයෙන් අපගේ ශාපය පිළිබඳ මරියා සඳහන් කරයි. මෙම කාරණා දෙකම යේසුස්වහන්සේගේ මරණය සහ නැවත නැඟිටීම තුළින ජයග්‍රහණය කරනු ලැබුවේ කෙසේද?*
*4. මරියා රිව්කා ට මෙසේ "ඔබ වටිනා දියණියකි." යේසුස්වහන්සේගේ මරණය සහ නැවත නැඟිටීම තුළින් අපව දෙවියන්වහන්සේට වටිනවා යන්න පෙන්වාදෙන්නේ කෙසේද?*

**ගැඹුරට යාම (කාලය ඇත්නම් සාකච්ඡාව තව දුරටත්)...**
*5. යේසුස්වහන්සේ මරණයෙන් පසු මරියාටත් ගෝලයින්ටත් කීපවරක්ම පෙනීසිටීම වැදගත් වන්නේ ඇයි?*
*6. ගීතාවලිය 22 එකට කියවන්න. යේසුස්වහන්සේ මෙසියස් බව තහවුරු කරන්නේ කුමන පද ද?*
*7. යේසුස්වහන්සේගේ මරණය සහ නැවත නැඟිටීම අතර දින 3ක් තිබුණි. යේසුස්වහන්සේගේ මරණයෙන් පසු උන්වහන්සේගේ ගෝලයින්ට දැනුනේ කුමක්ද කියා ඔබ සිතන්නේද?*

### නිගමනය
යෙසායා ප්‍රොපේතවරයාගේ වචන මෙනෙහි කරන්න, "එහෙත්, එතුමන් තුවාළ ලැබුවේ අපේ අපරාධ නිසා ය; පොඩි කරනු ලැබුවේ අපේ පව් නිසා ය. එතුමන් ලත් දඬුවමින් අපට සමාදානය ලැබී ඇත; එතුමන් ලැබූ පහරවලින් අපට සුවය ලැබී ඇත." (යෙසායා 53:5 නව අනුවාදය 1990). යේසුස්වහන්සේ මිනිසුන්ට ආදරයෙන් සැළකූ සේක. උන්වහන්සේ ඔවුන්ව කොතරම් ගැඹුරින් සහ මුළුමණින්ම අගය කලාද යත්, උන්වහන්සේ ශාපයට ලක්වී, දෙවියන්වහන්සේගෙන් වෙන්වීම විඳදරාගෙන අප වෙනුවෙන් මිය ගිය සේක. උන්වහන්සේ මරණින් නැඟිටුණු විට, උන්වහන්සේ සැබවින්ම දෙවියන්වහන්සේ බව ඔප්පු කළ සේක. යේසුස්වහන්සේ තම මරණය සහ නැවත නැඟිටීම තුළින් පෙන්නුම් කළ දයානුකම්පාව සහ බලය ගැන සළකා බලන්න. යේසුස්වහන්සේ ගැන සළකා බලන්න.

---

ඉදිරිය බැලීම

### අදාළ කරගැනීම
- දෙවියන්වහන්සේ විශ්වාසවන්ත බව පෙන්වූයේ කෙසේද?
- ඔබ දෙවියන්වහන්සේ පිළිබඳ ඉගෙනගත් දේ අදාළ කරගන්නේ කෙසේද?

### පුරුදු වෙන්න
- එකිනෙකාට කථාන්දරය කියන්න පුරුදු වෙන්න.

### බෙදාගන්න
- ඔබ කථාන්දරය බෙදාගන්නේ කා සමඟද?

### යාච්ඤා කරන්න
- ඔබ ඉගෙනගත් දේ ගැන දෙවියන්වහන්සේට ස්තුති කරන්න.
- එකිනෙකා වෙනුවෙන් යාච්ඤා කරන්න.
- සමාජයේ අන් අය වෙනුවෙන් යාච්ඤා කරන්න.

# 9 වෙනි පාඩම යේසුස්වහන්සේ සහ උන්වහන්සේගේ සමාව දැනගැනීම රිව්කා අදහාගනියි (ලූක් 24:36-50)

**සැළකිලිමත් වෙනවා**
- ඔබ කෙසේද කියා බෙදාගන්න.
- ත්‍යාගශීලිවන්තකම පුරුදු වෙන්න.

**නමස්කාරය**
- ගායනා සහ යාච්ඤාව තුළින් එකට නමස්කාර කරන්න.

**විශ්වාසවන්තකම සමරන්න**
- ජයග්‍රහන වලදී එකිනෙකා දිරිමත් කරන්න.

**දර්ශනයක් දෙන්න**
- යේසුස්වහන්සේගේ කැපවූ අනුගාමිකයන් වන පිණිස එකිනෙකා දිරිමත් කරන්න

ආපසු හැරී බැලීම

---

මරියා දෙවියන්වහන්සේගේ කථාන්දරය සමාලෝචනය කරමින් අපගේ පාඩම් මාලාව අවසානයට පැමිණ ඇත. උන්වහන්සේ අප සෑම කෙනෙක්ම දකින සේක අපව දන්නා සේක. උන්වහන්සේ ගැළවුම්කාරයාණන්, වහල්භාවයෙන් මිදීම සහ නිදහස අපට පිරිණමන මාංසවත් වූ දෙවියන්වහන්සේය. මළවුන් නැඟිටුවන්නට උන්වහන්සේ බලවත් වන සේක. එමෙන්ම මිනිසුනගේ ගැඹුරුතම ශෝකය සහ වේදනාව තුළ ඔවුන් සනසන්නට තරම් දයානුකම්පිත වන සේක.

**1 වෙනි පියවර: පෙන්වන්න.** එකම කොටස දෙවරක් බලන්න.
**2 වෙනි පියවර: කියන්න.** එම කොටසේ කථාව තමන්ගේ වචන වලින් කියන්නට කණ්ඩායමේ සාමාජිකයෙකුගෙන් ඉල්ලා සිටින්න.
**3 වෙනි පියවර: සම්පූර්ණ කරන්න.** කථාවේ අඩුපාඩු පුරවන්න හෝ නිවැරදි කිරීම් කරන්නට කණ්ඩායමට ඉඩ හරින්න.
**4 වෙනි පියවර: සාකච්ඡා කරන්න.** සාකච්ඡා කරන්නට ප්‍රශ්න:

*1. යේසුස්වහන්සේගේ ජීවිතය පිළිබඳ මරියාගේ සමාලෝචනය ගැන ඔබ වඩාත්ම කැමති වූයේ කුමක්ද? ඔබේ අවධානය ගත්තේ කුමක්ද?*
*2. ඔබට වඩාත්ම වැදගත් වූයේ යේසුස්වහන්සේගේ කුමන චරිත ගුණාංගයද?*
*3. අපගේ පාපය දෙවියන්වහන්සේ සමඟ සමාදාන වන්නේ කෙසේද?*
*4. ඇයට සමාව ලැබිය හැකි යයි රිව්කාට සහතිකයක් තිබුණේ නැත. අවසානයේදී ඇගේ විශ්වාසය ඇයට දැණුනු දේ මත හෝ ඇයගේ හැසිරීම මත නොව දෙවියන්වහන්සේගේ වචනය සහ උන්වහන්සේගේ සමාව මත බවට වැදගත් වන්නේ ඇයි?*
*5.ඔබගෙන් කිසිවෙක් රිව්කා සමඟ යාච්ඤා කළේද? ඔබගෙන් කිසි කෙනෙක් එසේ කරන්නට කැමතියි ද?*

**ගැඹුරට යාම (කාලය ඇත්නම් සාකච්ඡාව තව දුරටත්)...**
*6. යේසුස්වහන්සේගේ අනුගාමිකයෙකුට ඔවුන්ගේ ගැළවීම පිළිබඳ සහතිකයක් තිබීම වැදගත් වන්නේ ඇයි?*
*7. රිව්කාගේ පැකිලීමට සම්බන්ධ විය හැකිද? එසේ නම්, කරුණාකර ඔබගේ පැකිලීම් හෝ සැලකිල්ල බෙදාගන්න.*
*8. ඔබ දැන් යේසුස්වහන්සේට ඔබගේ ජීවිතය යටත්කිරීම සළකා බලනවාද?*

වැඩිදුර බැලීම

ඔබගේ භාෂාවෙන් මෙම කොටස නැරඹීමට ඔබේ ස්මාර්ට් උපාංගයෙහි මෙම QR කේතය භාවිතා කරන්න.

## නිගමනය

මෙම කොටසේ, රිව්කා යේසුස්වහන්සේ අනුගමනය කරන්නට තීරණය කිරීම අප දකිනවා. උන්වහන්සේ අනුගමනය කිරීමේදී ඔබගේ ජීවිතයට කුමන බලපෑම් ඇතිවේද කියා සළකා බලන්න. ඔබ පාපයෙන් මුදවා ගනු ලබන්නට කැමැත්තෙන් සිටිනවාද? පව් කමාව ලබා මිදීම ලබන්නට? දකිනු ලබන්නට දැනගනු ලබන්නට? විශ්වාසය තබන්නට කෙනෙකු සිටීමට? යේසුස්වහන්සේ අපගෙන් ඉල්ලා සිටින්නේ අව්‍යාජ ඇදහිල්ල සහ පාපය සම්බන්ධයෙන් අවංක පසුතැවිලිවීමයි. ඔබ උන්වහන්සේ වෙතට පැමිණි පසු, උන්වහන්සේ ඔබගේ ඇදහිල්ල දැක එයට දැන් සහ සදාකාලිකවම ගෞරව කරන බව ඔබට විශ්වාසය තැබිය හැක. දැන් ඔබ යේසුස්වහන්සේ ගැන සළකා බලා ඇති බැවින්, තීරණයක් ගැනීමට කාලයයි.  ඔබ උන්වහන්සේ අනුගමනය කරන්නේද?

** නායකයාගේ සටහන: යම් කෙනෙකුට යේසුස්වහන්සේ අනුගමනය කරන්න තීරණයක් ගන්නට අවස්ථාවක් දීම වැදගත් වන්නේය. "රිව්කා සමඟ කවුරුත් යාච්ඤා කළාද? ඔබ කවුරු හරි කැමතිද?" යයි අසන්නට අමතක නොකරන්න. ඒ අවස්ථාවේ සුදුසු නම් කණ්ඩායමෙන් පිට එක් එක් කාන්තාව පුද්ගලිකව හමුවන්න.*

---

**අදාළ කරගැනීම**
- දෙවියන්වහන්සේ විශ්වාසවන්ත බව පෙන්වූයේ කෙසේද?
- ඔබ දෙවියන්වහන්සේ පිළිබඳ ඉගෙනගත් දේ අදාළ කරගන්නේ කෙසේද?

**පුරුදු වෙන්න**
- එකිනෙකාට කථාන්දරය කියන්න පුරුදු වෙන්න.

**බෙදාගන්න**
- ඔබ කථාන්දරය බෙදාගන්නේ කා සමඟද?

**යාච්ඤා කරන්න**
- ඔබ ඉගෙනගත් දේ ගැන දෙවියන්වහන්සේට ස්තුති කරන්න.
- එකිනෙකා වෙනුවෙන් යාච්ඤා කරන්න.
- සමාජයේ අන් අය වෙනුවෙන් යාච්ඤා කරන්න.

ඉදිරිය බැලීම

# 10 වෙනි පාඩම යේසුස්වහන්සේ සමඟ ජීවත්වීම
## කිතුණු ජීවිතය ගත කිරීම (මතෙව් 28:18-20)

ආපසු හැරී බැලීම

### සැළකිලිමත් වෙනවා
- ඔබ කෙසේද කියා බෙදාගන්න.
- ත්‍යාගශීලීවන්තකම පුරුදු වෙන්න.

### නමස්කාරය
- ගායනා සහ යාච්ඤාව තුළින් එකට නමස්කාර කරන්න.

### විශ්වාසවන්තකම සමරන්න
- ජයග්‍රහන වලදී එකිනෙකා දිරිමත් කරන්න.

### දර්ශනයක් දෙන්න
- යේසුස්වහන්සේගේ කැපවූ අනුගාමිකයන් වන පිණිස එකිනෙකා දිරිමත් කරන්න

---

උඩ්දුර බැලීම

ඔබගේ භාෂාවෙන් මෙම කොටස නැරඹීමට ඔබේ ස්මාර්ට් උපාංගයෙහි මෙම QR කේතය භාවිතා කරන්න.

මරියා වෙනස්වූවා සේම, යේසුස්වහන්සේ අනුගමනය කරන්නේ නම් ඔබවද වෙනස් කරනු ලබන්නේය. උන්වහන්සේ අපව වඩාත් මහත් දෙයක් සඳහා කැඳවන සේක - උන්වහන්සේගේ අනන්‍යතාවය තුළින් ජීවත්වන්නටත් උන්වහන්සේගේ ගෞරවය, බලාපොරොත්තුව සහ යහපත්කම රැගෙන යාමටත් ය. අපවත් අන් අයවත් වෙනස් කර ඇති ජීවනයේ වචන බෙදාගන්නට උන්වහන්සේ අපව කැඳවන සේක. උන්වහන්සේ අප වෙනුවෙන් සිටින බව දැනගෙන, උන්වහන්සේගේ වචනය සහ ආඥා විශ්වාස කරන්නට අපව කැඳවන සේක. උන්වහන්සේ අපගේ සෑම අංශයක්ම දැනගෙන අපව තේරුම්ගන්නා බවත් දැනගෙන උන්වහන්සේ තුළ සුරක්ෂිත වන්නට අපව කැඳවන සේක.

**1 වෙනි පියවර: පෙන්වන්න.** එකම කොටස දෙවරක් බලන්න.
**2 වෙනි පියවර: කියන්න.** එම කොටසේ කථාව තමන්ගේ වචන වලින් කියන්නට කණ්ඩායමේ සාමාජිකයෙකුගෙන් ඉල්ලා සිටින්න.
**3 වෙනි පියවර: සම්පූර්ණ කරන්න.** කථාවේ අඩුපාඩු පුරවන්න හෝ නිවැරදි කිරීම් කරන්නට කණ්ඩායමට ඉඩ හරින්න.
**4 වෙනි පියවර:** සාකච්ඡා කරන්න. සාකච්ඡා කරන්නට ප්‍රශ්න:

*1. කිතුණු ජීවිතයේ කැඳවීම පිළිබඳ ඔබ වඩාත්ම කැමති වන්නේ කුමකටද? ඔබගේ අවධානය ගත්තේ කුමක්ද?*
*2. යේසුස්වහන්සේ අනුගමනය කිරීම ඔබට පෙනෙන්නේ කෙසේද?*
*3. යේසුස්වහන්සේගේ අවසාන වචන ඔබට බලපෑවේ කෙසේද?*
*4. ඔබගේ ජීවිතයේ යේසුස්වහන්සේට වෙනස් කරන්නට ඔබ කැමති අංශ මොනවාද?*

**ගැඹුරට යාම (කාලය ඇත්නම් සාකච්ඡාව තව දුරටත්)...**
*5. යේසුස්වහන්සේට ඔබගේ ජීවිතය වෙනස් කරන්නට ඉඩහැරීම පිළිබඳ ඔබ වඩාත්ම බියවන්නේ කුමක් ගැනද?*
*6. යේසුස්වහන්සේගේ වචන ඔබට අභියෝග කරන්නේ කෙසේද?*

### නිගමනය
යේසුස්වහන්සේ ගෝලයින්ට පැවසූ අවසාන වචන වන ප්‍රධාන අංග තුන ගැන කල්පනා කරන්න. යේසුස්වහන්සේට ස්වර්ගයේද පොළොවෙහිද සියළු බලය දී ඇති බව උන්වහන්සේ ප්‍රකාශ කරන සේක. ගොස් ගෝලයින් බිහිකරන්න, ඔවුන්ට අණ කර ඇති සියල්ලට කීකරු වෙන්නට උගන්වන්න යයි උන්වහන්සේ අපට අණ කරන සේක. එමෙන්ම උන්වහන්සේ අප සමඟ සිටින බවත්, ලොකාන්තය දක්වා සිටින බවත් උන්වහන්සේ අපට තහවුරු කරන සේක. යේසුස්වහන්සේගේ අවසාන ප්‍රකාශය,, ආඥාව සහ සහතිකය පිළිබිඹු කිරීම ඔබේ ජීවිතයට කෙසේ බලපාන්නේ දැයි සළකා බලන්න. යේසුස්වහන්සේ ගැන සළකා බලන්න.

ඔබ යේසුස්වහන්සේ අනුගමනය කරන්නට සූදානම් වූවත් නැතත්, තව දුරටත් උන්වහන්සේ පිළිබඳ ඉගෙනගන්නටත් උන්වහන්සේ අනුගමනය කළ හැක්කේ කෙසේද යන්නත් ඉගෙනගන්නට ඔබ කැමතියිද? ඔබගේ ආත්මික ගමනේ තව දුරටත් එක්ව ඉගෙන ගන්නටත් වැඩෙන්නටත් අවස්ථා තිබේ. *යේසුස්වහන්සේ ගැන සළකා බලන්න* පාඩම් මාලාව මෙයින අවසන් වූවත්, ඔබට ඊළඟට ගත හැකි පියවර කීපයක් ඇත. ඔබ එක් එක්කෙනාට ඊළඟ පියවර කෙසේ විය හැකි ද යන්න එකතුව සාකච්ඡා කරන්න. *රිච්කා සහ යේසුස්වහන්සේ දැනගැනීම* යනු ජීසස් ෆිල්ම් ප්‍රොජෙක්ට් හි යෝජිත මීළඟ පියවරයන්ය. නායකයාගේ මඟපෙන්වීමේ 4 වෙනි පියවරෙහි තවත් විස්තර ඇතුළත් කර ඇත. **ඔබ ඉගෙනගෙන ඇති දේ අන් අය සමඟ බෙදාගන්නට ඔබගේම *යේසුස්වහන්සේ ගැන සළකා බලන්න* කණ්ඩායමක් ආරම්භ කරන්නට ඔබට අවශ්‍ය වන්නට හැකිය. ඔබගේ කණ්ඩායම් නායකයාගෙන් උපදෙස් සහ සහයෝගය ලබාගනිමින් ඔබට මෙය නිවැරදි මීළඟ පියවරද යන්න තීරණය කළ හැකිය.**

---

ඉදිරිය බැලීම

### අදාළ කරගැනීම
- දෙවියන්වහන්සේ විශ්වාසවන්ත බව පෙන්වූයේ කෙසේද?
- ඔබ දෙවියන්වහන්සේ පිළිබඳ ඉගෙනගත් දේ අදාළ කරගන්නේ කෙසේද?

### පුරුදු වෙන්න
- එකිනෙකාට කථාන්දරය කියන්න පුරුදු වෙන්න.

### බෙදාගන්න
- ඔබ කථාන්දරය බෙදාගන්නේ කා සමඟද?

### යාච්ඤා කරන්න
- ඔබ ඉගෙනගත් දේ ගැන දෙවියන්වහන්සේට ස්තුති කරන්න.
- එකිනෙකා වෙනුවෙන් යාච්ඤා කරන්න.
- සමාජයේ අන් අය වෙනුවෙන් යාච්ඤා කරන්න.

# යේසුස්වහන්සේ ගැන සළකා බලන්න

සමාජයීය කුඩා කණ්ඩායම් සඳහා සති 10ක උපායමාර්ගයක්

Jesus Film Project®
A Cru Ministry